## ඉගෙනුම හා ඉගැන්වීමේ ක්‍රමය :

| | |
|---|---|
| I. පංති කාමර ඉගැන්වීම් | II. අභ්‍යාස හා භූමිකා රංගන |
| III. ශ්‍රව්‍ය/දෘශ්‍ය ඉදිරිපත් කිරීම් | IV. අඛණ්ඩ ඇගයීම් හා නිබන්ධන |
| V. ප්‍රායෝගික අභ්‍යාස හා පුහුණුවීම් | VI. ක්ෂේත්‍ර අධ්‍යයන |

## අයදුම්පත් ලබා ගැනීම

අයදුම්පත් ගාස්තු වශයෙන් රුපියල් 1000 ක මුදල ලබාදී ඇති වවුචර්පත හරහා රුහුණ විශ්වවිද්‍යාලයේ රැස් කිරීමේ ගිණුමට බැර වන සේ යොමු අංක 407022300000018 යටතේ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ලබා දී ගෙවීම් සිදුකල යුතුය. (ගෙවීම් සිදුකොට වවුචර්පතහි කාර්යාලයීය පිටපත (office copy) හා සම්පූර්ණ කරන ලද අයදුම්පත නියෝජ්‍ය ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර වෙත 2023 නොවැම්බර් 20 දින හෝ දිනට පෙර යොමු කල යුතුය.)

www.dceu.ruh.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් අයඳුම්පත් හා තොරතුරු ලබා ගත හැකිය.

අයදුම්පත් එවන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ “මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2023/2024” යනුවෙන් සඳහන් කරන්න.

## ඩිප්ලෝමා ප්‍රදානය

පහත සඳහන් සුදුසුකම් සපුරාලන ලද ශිෂ්‍ය/ශිෂ්‍යාවන් මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා සහතික පත්‍රය (SLQF Level 03) ලැබීමට සුදුසුකම් ලබති.

දූරස්ථ හා අඛණ්ඩ
අධ්‍යාපන ඒකකය හා
සමාජවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර

041 - 2222681/2
041- 2222681

dceu@admin.ruh.ac.lk
sociology@hss.ruh.ac.lk



# මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

# Diploma in Psychological Counselling

## 2023/2024

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය සහ
සමාජවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර

## හැඳින්වීම

මනෝවිද්‍යාත්මක උපදේශනය යනු යම් ගැටලුවකට මැදිහත් වී ඇති පුද්ගලයකුට ඔහු සතු ශක්තීන් තුළින්ම එම ගැටලුවෙන් මිදීමේ හැකියාව ලබා දෙන යාන්ත්‍රණයකි. ඇතැම් විට මෙය පුද්ගල හෝ සමාජ ප්‍රශ්නයක් විය හැකිය. බොහෝ විද්වතුන් සඳහන් කරන පරිදි පුද්ගලයන්ට විවිධ අවස්ථාවල දී මුහුණ දීමට සිදුවන ජීවන ගැටලු, පරාජයන් හා පීඩන හමුවේ නොසැලී සිටීමට හා ඒවාට විසඳුම් සපයා ගැනීමට උපදේශනය සාර්ථකව ප්‍රයෝජනවත් වී තිබේ. උපදේශනය වනාහී පුද්ගලයන් ගැටලුවලට මැදිහත් වීමේ දී පමණක් උපකාරී වන්නක් නොවේ. පුද්ගලයන් තුළ සැඟවී ඇති දක්ෂතා වර්ධනය කර ගැනීමට, තමාගේ අනාගත ගමන් මාර්ගය සැලසුම් කර ගැනීමට, අතීත හා වර්තමාන ගැටලු විසඳා ගැනීම තුළින් අනාගත අපේක්ෂා වර්ධනය කර ගැනීමට ද උපදේශනය මහෝපකාරී වේ. තමා තුළින් ම තමාව හඳුනා ගැනීම කෙරෙහි මනෝවිද්‍යාත්මක උපදේශනය ප්‍රබල හේතුකාරකයක් වී ඇත. මේ අනුව මනෝවිද්‍යාත්මක උපදේශනය යනු ඒ හා සම්බන්ධ අධ්‍යාපනය ලබා දීමක් පමණක් නොවේ.

එය පුද්ගල ගැටලු විසඳීමට හා පුද්ගල පෞරුෂය වර්ධනය කිරීමට උපකාර වන සාර්ථක මැදිහත් වීමකි. එබැවින් සාර්ථක උපදේශන මැදිහත්කරුවෙක් සතුව එම විෂය සම්බන්ධව මනා දැනීමක් හා පුහුණුවක් පැවතීම වැදගත් වේ.

මෙම අවශ්‍යතාවයන් සපුරාගැනීම අරමුණු කර ගනිමින් රුහුණ විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය හා සමාජවිද්‍යා අධ්‍යයනාංශය මගින් මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව මෙහෙයවනු ලබයි.

මෙම පාඨමාලාව ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයට අනුව එහි තුන්වන මට්ටමට (SLQF -03) අයත් ය. එය NVQ 5 වන මට්ටමට සමාන වේ.



## ඉලක්ක ගත කණ්ඩායම්

සමාජ සුබසාධන, ප්‍රජා සංවර්ධන, ආරක්ෂක, සෞඛ්‍ය, ගුරු වෘත්තියේ හා උපදේශන ක්ෂේත්‍රයේ රැකියාවක නිරතවූවන්ට හා එම ක්ෂේත්‍රයෙහි රැකියා අපේක්ෂා කරන්නන්ට, උපදේශනය පිළිබඳ වැඩිදුර අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නන්ට.

## ඇතුලත්වීමේ සුදුසුකම්

එක් වරක දී අවම වශයෙන් විෂයන් 03 ක් සහිතව අ.පො.ස. උසස් පෙළ සමත්වීම

**හෝ**

පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් උසස් සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම හා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයකින් සමත් වීම.

**හෝ**

රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන අ.පො.ස. උසස් පෙළ විභාගයට සමාන විභාගයකින් සමත් වී තිබීම.

## පාඨමාලා ගාස්තු

සම්පූර්ණ පාඨමාලා ගාස්තුව 75,000.00 කි.

## සම්මුඛ පරීක්ෂණය හා ලියාපදිංචිය

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් ලියාපදිචි වීමේදී පාඨමාලා ගාස්තුවෙන් රු 40,000.00 ක් ගෙවිය යුතු අතර ඉතිරිය පාඨමාලාව ආරම්භ වී මාස තුනක් ඇතුළත ගෙවීම අනිවාර්ය වේ.

## කාලය

පාඨමාලාවේ කාලය මාස 12 කි. සෑම සෙනසුරාදා දිනකම සහ සෑම මසකම ඉරිදා දින 2ක් පෙ.ව. 8.00 සිට ප.ව 5.00 දක්වා පාඨමාලාවේ දේශන පැවැත්වේ. දිනකට දේශන පැය ගණන පැය 08 කි. මීට අමතරව ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සහ ප්‍රායෝගික පුහුණුවීම් සඳහා අමතර කාලයක් වෙන් වේ. එමෙන්ම දේශන සඳහා 60% සහභාගීත්වය අනිවාර්ය වේ.